# ගමට ධනය දෙන


# අපනයන ගම්මාන

අපේ රටට විදේශ විනිමය ලබා දෙන ප්‍රධාන මාධ්‍යයන් ලෙස තේ, පොල්, රබර් පමණක් දිගු කාලයක් තිස්සේ පැවතීම නිසා විදේශ සම්පත් මෙරටට ඇදී ආවේ අවම වශයෙනි. මෙම ද්‍රව්‍යයන්හි ආදායම ද අපට අවශ්‍ය විදේශ සම්පත් ප්‍රමාණයට අනුකූලව ක්‍රමයෙන් අඩුවන ලකුනු පෙනී ගිය නිසා අපනයන ප්‍රමාණය වැඩි කිරීම ජාතික අවශ්‍යතාවයක් වුනා. එම අවශ්‍යතාවය ඉටු කිරීමේ එක් මාර්ගයක් නම්, සුළු කෘෂි කාර්මික භෝග අපනයන ප්‍රමාණය වැඩි කිරීමයි.

මෙම කර්තව්‍යය ඉටු කිරීමට තවත් හේතු ගණනාවක් තිබෙනවා. වෙනත් වචන වලින් කිවහොත් වැඩි වාසි ප්‍රමාණයක් අපට ලැබෙනවා. ගම්බද ජනතාව ජනගහනයෙන් 80% ක් සිටින, ප්‍රධාන වශයෙන් කෘෂි කාර්මික සමාජයක් ඇති අපේ රටේ අපනයනය සඳහා කෘෂි ආශ්‍රිත කර්මාන්ත ඇති කිරීම තුලින් ගැමි ජනතාවගේ රැකියා ප්‍රශ්නය ්සඳී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් තත්ත්වයකට පත් වෙනවා. ග්‍රාමීය මට්ටමේ කෘෂි ආශ්‍රිත නිෂ්පාදනයන්හි වටිනාකම හා ඉල්ලුම විදේශ වෙළෙඳ පොලවල වැඩි උනත් දේශීය සුළු නිෂ්පාදකයා එම කාර්යයට මැදිහත්වීම හේතු ගණනාවකින් නැවතුනා. ඒ අවශ්‍ය ආධාර නොලැබීම හා අලෙවි පහසුකම් නොමැතිවීම වැනි කරුණුයි.

මේ ප්‍රශ්නය තේරුම් ගත් එවකට වෙළඳ හා නාවික ඇමති ලලිත් ඇතුලත්මුදලි මහතා සුළු ගොවීන්ට ආධාර කිරීමට වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට නියම කළා. මෙහි ප්‍රතිඵලය වුනේ 'අපනයන සංවර්ධන ගම්මාන' සංකල්පය බිහිවීමයි.

එම වැඩපිළිවෙලේ නියමු ව්‍යාපෘතියක් ලෙස, 1981 ජූලි මාසයේදී, දඹදෙනියේ දී පළමු වන අපනයන ගම බිහිවුනා. ජනගහනය 2,000 ක් පමණ වෙසෙන අක්කර 675 කින් පමණ සමන්විත මෙම ගම පිළිබඳව කරන ලද මූලික සමීක්ෂණයකදී ගම පිළිබඳව ඉතා වැදගත් කරුණු රාශියක් හෙළිවුනා. ගමේ ප්‍රධාන වැවිල්ල වන බුලත් වගාවෙහි ගොවීන් ගෙන් සියයට 80 ක් පමණ නිරත වෙනවා. එහෙත්, වගාවට යොදවා ගෙන ඇති ඉඩම් වලින් සියයට 62 ක් උපරිම ලෙස වගාවට යොදවා ගෙන නැත. ගම්මිරිස්, කෝපි, ඉඟුරු, අන්නාසි හා එළවළු වැනි අපනයනයට සුදුසු වගාවන් රාශියක් ද වගා කෙරෙනවා. මෙයට අමතරව අපනයනයට විශාල ඉඩකඩ ඇති හස්ත කර්මාන්තද ගමේ තියෙනවා. අපනයනයට



ගම්මානයක තරුණියන් සිය ලාභ ලබා ගනිති.

අවශ්‍ය මූලික අංශයක් වන උසස් වර්ගයේ බුලත් නිපදවීමට ගොවීන් උනන්දුවී නෑ. ඒ අතරම ඔවුන් අතරමැදියන්ගේ ග්‍රහනයටද අසුවී සිටියා.

මේ පසුබිම මත එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා දඹදෙනිය අපනයන නිෂ්පාදන ගම්මානය අපනයන සංවර්ධන මණ්ඩලය මගින් පිහිටුවනු ලැබුවා. 450 දෙනෙක් වන කොටස් කරුවන් ගෙන් වැඩි දෙනෙක් ප්‍රදේශයේ ගොවීන් වීම මෙම සමාගමේ කැපී පෙනෙන ලක්ෂණයක්. ගොවීන් විසින් යොදන ලද රුපියල් 15,000 ක් මුදල සඳහා වර්ෂය අවසානයේදී ඔවුන්ට සියයට 25 ක ලාභයක් ලැබුනා. මෙම ප්‍රමාණය හෝටල් සංචාරක ව්‍යාපාරය වැනි ගම්බද ජනතාවට සහභාගි විය නොහැකි අනෙක් ව්‍යාපාර රාශියකට වඩා වැඩදයක බව පෙනී යනවා.

මෙම සමාගමේ අනෙක් වත්තේ, ප්‍රදේශයේ ජනතාවට විශාල ආදායමක් ගෙන දෙන එම ආර්ථික යේම ඇති නිෂ්පාදන අපනයනය කිරීම—ඒ සමගම මේ ප්‍රයත්න යෙන් 200 කට අධික පිරිසකට රැකියා පහසුකම්ද ලැබුනා. තේ වෙළඳාම අලංකාර කරන මෙම සමාගම නිපදවූ තලකොල පෙට්ටි වලට විශාල ඉල්ලුමක් ඇතිවී තිබෙනවා. පෙර, රුපියල් 4/- ට පමණ විකුණූ මෙම පෙට්ටි යක් දැන් රු. 7.50 ක් 8.50 ක් අතර මිලකට විකිණිය හැකි අතර ඔවුන් එම පෙට්ටි 40,000 ක් නිපදවා තිබෙනවා. තවත් පෙට්ටි දෙලක්ෂයකට ඇණවුම් ඔවුන් අතේ පවතී.

මෙම සාර්ථක උත්සාහය නිසා කුරුණෑගල ප්‍රදේශයේ තරුණ ගොවීන් එක්වී, කුරුණෑගල කෘෂිකර්ම නිෂ්පාදන සමාගමද පිහිටුවා ඇත.



අපනයන භාණ්ඩ නිපදවති. (ඡායාරූප අපනයන සංවර්ධන මණ්ඩලයෙනි.)

මේ වන විට මෙම ව්‍යාපෘතියට ගැමි ජනතාවගෙන් කොතරම් අගනා ප්‍රතිචාරයක් ලැබී ඇත්දැයි කිවහොත්, දිවයිනේ දස දෙස අපනයන ගම්මාන 21 ක් පිහිටු වීමට හැකිවී තිබෙනවා. එම සමාගම් වල කොටස් කරුවන් 6,069 ක් සිටින අතර ඔවුන් කොටස් 1,62,956 කට හිමිකම් කියනවා. මෙම සමාගම් වල ප්‍රධාන නිෂ්පාදන වන්නේ තල කොල පෙට්ටි, සුදු කොහු නිෂ් පාදනය, පලතුරු, එළවළු, උණ වලින් තැනෙන අලංකාර භාණ්ඩ, කජු, තල් නිෂ්පාදන ඖෂධීය පැලෑටි, අත්කම්

භාණ්ඩ විද්‍යුත් උපකරන, පැපොල් කිරි, කුඩ හා අත් යන්ත්‍ර රෙදි යනාදියයි. කලාවැව පැලකුඩා, මදුරන්කුලිය, සාලිය-අශෝකපුර, යටිනුවර, කටුවන, මුලතිව්, දෙනිපිටිය, කටුගම්පොල, ගම්පහ, ඉදිගොල්ල, රත්ගම, නැදගමුව, පේදුරුතුඩුව, චාවාකච්චේරි, මඩ කලපුව, හොරණ, හෝමාගම, බණ්ඩාරවෙල, ලෙනදෙර, රත් මලාන, අත්තිඩිය, බලන්ගොඩ බිංගිරිය, ඇතුගල්පුර හා වවුනියාව යන ප්‍රදේශවලට ඒවා විහිදී තිබේ.

මේ අනුව, ගම්බද ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවන, අපරටට විදේශ විනිමය ගෙනෙන මෙම සංකල්පයට සාර්ථක අනාගතයක් ඇති බව කිවමනා නොවේ.

අපනයන සංවර්ධන මණ්ඩලයේ
සහකාර අධ්‍යක්ෂිකා

**චන්ද්‍රකාන්ති ධර්මදාස විසිනි.**